# ග්‍රාමීය කාන්තාවන්ට ආදායම් ඉපයීමේ අවස්ථා

ආයතන අධ්‍යයනයකින්

ග්‍රාමීය කාන්තාවන්ට මුදල් ඉපයීමේ අවස්ථා හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ කර ගත් අධ්‍යයනයක් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ළඟදී අවසන් කරන ලදී. ලංකාවේ තෝරා ගත් ප්‍රදේශ පහකින් ගම් දෙක බැගින් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගැණිනි. අධ්‍යයනයේ නම් කර ඇති අන්දමට මෙම ප්‍රදේශ නම් කුලියාපිටිය, යාපනය, රාජාංගනය, කඳු පළාත සහ බැමිණිවත්තයි. මෙම අධ්‍යයනයේ මතු වූ ප්‍රධාන කරුණු පහතින් දැක්වේ.

කාන්තාවන්ගේ අධ්‍යාපන තත්වය අනුව මෙම පළාත් පහ සැලෙහන වෙනස්කමක් පෙන්නුම් කළේය. උදාහරණයක් වශයෙන් අවුරුදු 14 65 අතර වයස් කාණ්ඩයේ අවුරුදු පහකට වඩා පාසැල් ගොස් ඇති සංඛ්‍යාව සැළකුවහොත් 71% කින් යුත් බැමිණිවත්ත පළමුවන තැනට පැමිණුන අතර 47% කින් යුත් රාජාංගනය පස් වන තැනට පැමිණුනි. එහෙත් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) අධ්‍යාපනය සහිත කාන්තාවන් වැඩිම සංඛ්‍යාවක් සිටියේ කඳු පළාතේය.

## රාජාංගනය

කාන්තාවන් එක් එක් කාර්යයන්හි‌ගේ නියුක්ත වීමත් මෙම අධ්‍යයනයේදී සොයා බලන ලදී. කෘෂිකර්ම කටයුතුවල නියුක්තිය වැඩිපුරම පෙන්නුම් කරන ලද්දේ රාජාංගනයේය, මෙම ප්‍රදේශය ප්‍රධාන කෘෂිකාර්මික ප්‍රදේශයක් වීමත්, වෙනත් රැකියා අවස්ථා මඳ වීමත් මෙයට හේතු වශයෙන් දැක්විය හැක. මෙම අධ්‍යයනයෙන් පෙනී යන තවත් කරුණක් නම් තමන්ගේ ගොවිතැන් කටයුතු වලින් පිටස්තර කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන කාන්තාවන් සංඛ්‍යාව අධ්‍යයනය කළ සෑම පළාතකම ඉතාම අඩු වීමයි. මෙයින් පෙනී යන්නේ තමාගේ ගොවි පලින් පිටස්තර කෘෂිකාර්මික කටයුතු කාන්තාවන්ට රැකියා අවස්ථා වශයෙන් වැදගත් නොවීමයි. කාන්තාවන් කෘෂිකාර්මික කටයුතු වල යෙදෙන්නේ අර්ධකාලීන වශයෙනි. පූර්ණ කාලීන ලෙස කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉතාම අඩු විය. අධ්‍යයනය කළ සෑම ගෘහයකම පාහේ පූර්ණකාලීන වශයෙන් ගෘහ කටයුතුවල යෙදෙන ගෘහනියක් විය. දේශීය වශයෙන් වුවත් කාන්තාවන්ගෙන් 2/5 ක් පමණ ගෘහ කටයුතුවල පමණක් නියුතු අය වේ. කාන්තාවන් ගෘහ කටයුතුවල යෙදීමත්, කෘෂිකාර්මික කටයුතුවල අර්ධකාලීන වශයෙන් නියුතු වීමත් නිසා පූර්ණකාලීන රැකියා රහිත බවක් එතරම් දුරට පෙනී ගියේ නැත. එහෙත් අර්ධකාලීන වශයෙන් රැකියා රහිත බව පැහැදිලි විය. අර්ධකාලීන රැකියා රහිත බව වැඩිපුරම පෙනී ගියේ රාජාංගනයේය.

## කුලියාපිටිය

තමාගේ ගොවිතැන් කටයුතු වලින් පිට රැකියා නියුක්තිය (වේතනයක් හෝ මුදල් ලාභයක් ලබන කටයුතු) සම්බන්ධයෙන් පෙනී ගිය කරුණක් නම්, ඒ ඒ පළාත් අනුව රැකියා නියුක්තිය වෙනස් වීමයි. කුලියාපිටියේ පුහුණු කම්කරුවන් වශයෙන් සේවයද, ස්වරැකියා හා නුපුහුණු කම්කරු වැඩ යාපනයේද, රජයේ රැකියා හා නුපුහුණු කම්කරු වැඩ කඳු පළාතේද, පුහුණු හා නුපුහුණු කම්කරු වැඩ බැමිණිවත්තේද වැදගත් රැකියා අවස්ථා විය. රාජංගනය අනෙක් පළාත්වලට වඩා වෙනස් විය. මෙහි කෘෂිකර්මයෙන් පිට රැකියාවල නියුතු කාන්තාවන් සංඛ්‍යාව ඉතාම අඩු විය. රාජාංගනයේ ගොවිපලෙන් පිට රැකියාවල නියුතු කාන්තාවන් සංඛ්‍යාව තුන් දෙනෙක් පමණ වූ අතර, කඳු පළාතේ එම සංඛ්‍යාව 40 ක් විය.

කාන්තාවන්ගේ දක්ෂතා හා හැකියාවන් සැළකුවහොත් එම හැකියාවන් පහත සඳහන් අංශ වලින් යුක්ත විය. රෙදි විවීම, පන් වැඩ, මැහීම හා ගෙතීම, පොල් අතු විවීම, ආහාර සකස් කිරීම, නොයෙකුත් හස්ත කර්මාන්ත, ලඝුලේඛනය, කුකුල් පාලනය, මලු සෑදීම, බතික් වැඩ සහ බීඩි එතීම. කාන්තාවන් ඉගැනීමට කැමැත්තක් දැක්වූ දක්ෂකම්/හැකියාවන් වුවේත් මේවාමය. තවත් පෙනී ගිය කාරණයක් නම් මෙම හැකියාවන් ආදායම් උපයන මාර්ගවල යෙදවුවේ ඉතා ස්වල්ප වශයෙන් බවයි. මෙ බව පහත දැක්වෙන වගුවලින් පිළිබිඹු වේ.

ක්‍රමානුකූලව ගෙවතු වගා කිරීම එතරම් ජනප්‍රිය නොවීය. අමතර ආදයමක් ලබා දෙන්නක් වශයෙන් හෝ වියදම් ඉතිරි කර ගැනීමේ මාර්ගයක් ලෙස ගෙවතු වගාවේ වැදගත්කම පෙනී ගියේය. එසේම පවුලේ ගොවිපලවල බෝග රටාවන් වඩා ආර්ථිකමය වන ආකාරයට වෙනස් කිරීම මගින් මුදල් ආදයම වැඩි කළ හැක්වාක් මෙන්ම කාන්තාවන්ට ගොවිපල කටයුතුවල යෙදීමේ අවස්ථාවන්ද වැඩි කළහැකි වනු ඇත.

ඒ ඒ පළාත්වල ලබා ගැනීමට හැකි අමු ද්‍රව්‍ය හා කාන්තාවන්ගේ දක්ෂකම්/හැකියාවන් සැළකිල්ලට ගනිමින් නොයෙක් කුඩා පරිමාණයේ කර්මාන්ත හෝ ගෘහ කර්මාන්ත පටන් ගැනීමේ හැකියාවන් අධ්‍යයනයේ පෙන්නා දී ඇත. මෙවැනි කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන බාධකය වන්නේ නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවියයි. බොහෝවිට මෙවැනි ද්‍රව්‍ය සඳහා ඉල්ලුම ඇත්තේ නිෂ්පාදනය වන ප්‍රදේශයෙන් පිටයි. මේ නිසා මෙවැනි කටයුතු ආරම්භ කිරීමට පළමු අලෙවිය පිළිබඳව සැළකීම ඉතා වැදගත් වේ. එසේම ප්‍රදේශයේම ඉල්ලුමක් තිබෙන ද්‍රව්‍ය නිෂ්පාදනයට වැඩි සැළකිල්ලක් යෙදීම වඩා සුදුසුය.

කුඩා කර්මාන්ත හා ගෘහ කර්මාන්ත සඳහා ප්‍රදේශයෙන්ම ලබා ගත හැකි අමු ද්‍රව්‍ය පමණක් නොව, පිටතින් ලබා ගත හැකි අමු ද්‍රව්‍යද යොද ගත හැක. මෙවැනි කර්මාන්තද මෙහි නම් කර ඇත. අලෙවියට අමතරව කර්මාන්ත සම්බන්ධයෙන් මතු වන ප්‍රධාන අවශ්‍යතා නම් යෙදවුම් සැපයීම, ණය පහසුකම් ලබාදීම හා පුහුණුවයි. මේ සම්බන්ධයෙන් රජයේ ආයතන, ග්‍රාමීය ආයතන හා ස්වේච්ඡා සේවා ආයතන වලින් බලාපොරොත්තු වන සේවයන්ද අධ්‍යයනයේ දක්වා ඇත.

## 1 වන වගුව

### ගොවි පවුල්වල කාන්තා සාමාජිකයින් සතු විශේෂ නිපුණත්වයන්

(විශේෂ නිපුණත්වයක් සතු කාන්තාවන් සංඛ්‍යාව, ප්‍රදේශයේ මුළු කාන්තා ශ්‍රමයේ ප්‍රතිශතයක් ලෙස)

| | කුලියාපිටිය | යාපනය | රාජාංගනය | කඳු පළාත | බැම්බිවත්ත |
|---|---|---|---|---|---|
| ෆරදි විවීම | 61 | 04 | 14 | 23 | 29 |
| ගෙතීම | — | — | — | 26 | 23 |
| මැහුම් වැඩ | 08 | 43 | 24 | 52 | 41 |
| පැදුරු විවීම | 27 | 46 | 55 | 06 | 22 |
| මළු විවීම | — | — | 41 | 13 | 11 |
| පොල් අතු විවීම | — | 07 | — | 10 | 01 |
| ආහාර සැකසීම | — | — | — | 06 | 08 |
| වෙනත් † | — | 02 | 03 | — | 22 |

† වෙනත් – හස්ත කර්මාන්ත, ලසුලේඛනය සහ යතුරු ලියනය, කුකුල් පාලනය, බතික් කර්මාන්තය, මල් සෑදීම, බිඩි එතීම ආදිය.

## 2 වන වගුව

### ආදයමක් ඉපැයීම පිණිස නිපුණත්වයන් යොද ගැනීම

විශේෂ නිපුණත්වයන් සතු කාන්තාවන් සංඛ්‍යාව (ප්‍රතිශතයක්සේ)

| | කුලියාපිටිය | යාපනය | රාජාංගනය | කඳු පළාත | බැම්බිවත්ත |
|---|---|---|---|---|---|
| විශේෂ නිපුණත්ව සතු | 42 | 80 | 35 | 26 | 50 |
| ආදයම් ඉපැයීම් පිණිස | 14 | 08 | 03 | 09 | 09 |